**සීමාසහිත ලංකා පොහොර සමාගම - 2017/2018**

**-----------------------------------------------------------**

සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන  අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

## 1.4 සමාගම පිහිටුවීම

**-------------------**

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1964 වර්ෂයේදී ජර්මන් සමූහාණ්ඩුවේ මූල්‍ය හා තාක්ෂණික දායකත්වය සහිතව සීමාසහිත ලංකා පොහොර සමාගම  ස්ථාපනය කරන ලදී. 1987 අංක 23 දරන රජයට පවරාගත් ආයතන පොදු සමාගම් බවට පත්කිරීමේ පනතට අනුකූලව 1992 සැප්තැම්බර් 15 දින සිට බල පැවැත්වෙන පරිදි සීමාසහිත ලංකා පොහොර සමාගම නමින් යලි ස්ථාපනය කරන ලද අතර, වර්තමානයේ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර පවත්වාගෙන යනු ලබයි.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.18,917,610,958 ක්, වෙළඳ ණයගැති වටිනාකම රු.293,697,701 ක් සහ ණය හිමි වටිනාකම රු.2,373,490,543 ක් සඳහා ශේෂ සනාථන ඉදිරිපත් නොකෙරුණි. තවද භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.18,917,610,958 සඳහා රාජ්‍ය භාණ්ඩාගාරයේ ගිණුම්වලින්ද තහවුරු කරගැනීමට විගණනයේදී අපොහොසත් විය. එසේ වුවද සමාගම විසින් භාණ්ඩාගාරයෙන් කරන ලද ඉල්ලීමට අනුව 2018 අගෝස්තු 03 දින රු.3,145,012,000 ක් ලැබී තිබුණු අතර තවදුරටත් ලැබිය යුතු ශේෂය රු.**15**,772,**598**,958 ක් විය.

2017 අංක 24 දරන දරන දේශීය ආදායම් පනතේ 195(අ)1 ඡේදය ප්‍රකාරව සමාගම ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමෙන් ජනිත වූ ප්‍රත්‍යාගණන අතිරික්තය විලම්භිත බදු ගණනයේදී සැලකිල්ලට නොගෙන සමාලෝචිත වර්ෂයේ බදු ගණනය කර තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 මාර්තු 31 දිනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මඟින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම විගණනයේ විෂය පථය හා සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

- විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූළ වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 2002 මැයි 24 දිනැති අංක පීඑෆ්/පීඊ/21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 06 ඡේදය | එක් එක් කාර්තුව අවසානයේ ආර්ථික සේවා ගාස්තු එළඹෙන ඊළඟ මාසයේ 20 වන දිනට පෙර ගෙවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ කාර්තු 04 සඳහා ගෙවිය යුතු එකතුව රු.17,244,452 ක් වූ ආර්ථික සේවා ගාස්තුව 2018 සැප්තැම්බර් 30 දින වන විටත් ගෙවා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.24,536,064 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.139,592,032 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.164,128,096 කින් පිරිහී තිබුණි. විකුණුම් ආදායම රු.1,023,352,005 කින් වැඩි වුවද, විකුණුම් පිරිවැය රු.1,222,880,719 කින් වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී 2013/2014 වර්ෂයේ රු.178,459,452 ක් පැවති බදු පසු ශුද්ධ ලාභය 2015/2016 වර්ෂය අවසානයට රු.603,272,829 ක් වූ දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. එහෙත් පොහොර සහනාධාර ක්‍රමය ඉවත් කිරීමත් සමඟ 2016/2017 වර්ෂයේ ශුද්ධ ලාභය රු.139,592,032 ක් දක්වා අඩුවී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ එය රු.24,536,064 ක අලාභයක් බවට පත්ව තිබුණි. කෙසේ නමුත් මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය දේපල පිරියත උපකරණ ක්ෂය හා රජයට ගෙවූ බදු නැවත ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ දායකත්වය පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.119,942,036 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර මාර්ග අලුත්වැඩියා කිරීමට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ සහ අයවැය ලේඛනයෙහි රු.මිලියන 85 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(ආ) මිශ්‍රණාගාරයක්, කේබල් පද්ධතියක්, සූර්ය බල පද්ධතියක් ස්ථාපිත කිරීම සහ ජෙනරේටරයක් මිලදී ගැනීම සඳහා එකතුව රු.මිලියන 29.82 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් කර තිබුණත්, මේ සඳහා වාර්ෂික අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි.

#### 4.1.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුල යූරියා, එම්ඕපී, ටීඑස්පී යනාදි සෘජු පොහොර වර්ග හා මිශ්‍ර පොහොර අලෙවියෙන් රු.බිලියන 6.794 ක ආදායමක් ලබා ගැනීමට ඉලක්ක කර තිබුණද එක් එක් කන්නයේ පොහොර අවශ්‍ය කරන කාල වකවානු කල්තියා හඳුනාගෙන පොහොර ආනයනය නොකිරීම නිසා

වෙළඳපළ කොටස අඩු වීමෙන් තථ්‍ය අලෙවි ආදායම රු.බිලියන 3.403 ක් වී තිබුණු අතර ලබා කරගත හැකිවූ අලෙවි ආදායම සියයට 50 ක මට්ටමක පැවතුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 10.1 වගන්තිය අනුව රාජ්‍ය නිලධාරියෙකු විදේශගතවීමට පෙර ඒ සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවසරයගත යුතු වුවද, එසේ අවසර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ සභාපතිවරයා සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ස්විස්ටර්ලන්තයේ විදේශ සංචාරයක නිරත වී තිබුණි.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන සමාගම විසින් 2013/2014 මූල්‍ය වර්ෂයේ මහජන බැංකුවේ ආරම්භ කළ රු.මිලියන 500 ක ස්ථාවර තැන්පතුවක් මුදල් කරගෙන තිබුණි.

**4.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

සීමාසහිත ලංකා පොහොර සමාගමේ වර්ෂ 10 කටත් පෙර සිදුවූ පොහොර තොග ඌනතාවයන් සම්බන්ධයෙන් අලෙවි නියෝජිතවරුන් සිවු දෙනෙකුට පවරා තිබූ නඩු විභාග වෙමින් පැවතුණි.

**4.4 කාර්යමණ්ඩල පරිපාලනය**

2015 වර්ෂයේ සිට සාමාන්‍යාධිකාරී තනතුර සහ මානව සම්පත් කළමනාකරණ තනතුර පුරප්පාඩු වී පවතින අතර, මෙම තනතුරු සඳහා වැඩ බැලීමේ නිලධාරීන් පත්කර ඇතත්, අදාල පුරප්පාඩුව පිරවීමට 2018 සැප්තැම්බර් 30 වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳව එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ලංකා පොහොර සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) එසේ වුවද, සමාගම විසින් හඳුනාගෙන තිබුණු තිරසාර සංවර්ධන ඉලක්ක ඉටුකර ගැනීම සඳහා ආයතනයේ විවිධ අංශ වෙත නිශ්චිතව වගකීම් බෙදා හැර නොතිබුණි.

(ආ) තිරසාර අරමුණු ක්‍රියාත්මක කිරිම සඳහා සමාගමේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් ලෙස රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන දක්වා තිබුණු අතර, සමාගම විසින් එම ආයතන මොනවාද යන්න නිශ්චිතව හඳුනා නොගැනීම හේතුවෙන් සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපණය නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමේ කාර්යසාධනය මැන බැලීම සඳහා ක්‍රියාත්මක කල යුතු තොරතුරු පද්ධතියට අන්තර්ජාල පහසුකම් සහිත පරිගණක 41 ක් අවශ්‍ය වුවද සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ එම පහසුකම් සහිත පරිගණක 26 ක ඌනතාවයක් පැවතුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 දියර පොහොර ප්‍රසම්පාදනය

සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් දියර පොහොර මිලදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර එම ගිවිසුමේ 6.5 ඡේදය ප්‍රකාරව රු.125,000,000 ක බැංකු ඇපකරයක් එකී පෞද්ගලික සමාගමේ තැන්පත් කර එම ඇපකරය උපයෝගී කරගෙන ණය ලබාගැනීමට එම පෞද්ගලික සමාගමට පහසුකම් සලසා දී තිබුණි. ඒ අනුව එම ඇපකරය උපයෝගී කරගෙන රු.112,500,000 ක බැංකු අයිරාවක් එම පෞද්ගලික සමාගම විසින් ලබාගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.5 ඡේදය ප්‍රකාරව ආනයනය කරන භාණ්ඩ සඳහා පමණක් ඇප සුරක්ෂන තැබිය යුතු වුවද, දේශීය සැපයුම්කරුවන් සඳහා ඇප සුරක්ෂන තැබීමක් අවශ්‍යා නොවන පසුබිමක සහ අවම අලෙවිය සිදු කලේ නම් මසකට රු.3,240,000 ක දියර පොහොර තොගයක් ආරක්ෂිත තොගය ලෙස පවත්වාගෙන යාම ප්‍රමාණවත්ව තිබියදී ඊට අදාල අත්තිකාරම් මුදලක් ලබාදෙනු වෙනුවට මෙසේ විශාල වටිනාකමකින් යුත් ඇප බැඳුම්කරයක් ලබාදීම විගණනයේදී ගැටලු සහගත විය.

### 6.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2016/2017 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2018 සැප්තැම්බර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 6.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර වියදම් විෂයයන් 46 ක සියයට 40 ට වැඩි විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

### 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

2016/2017 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 4.7 (ආ) ඡේදය යටතේ පෙන්වා දුන් නුවරඑළිය ප්‍රදේශයේ සංචාරක බංගලාවක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පැවති අඩුපාඩු නිවැරදිකර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර ගිණුම් පොත්පත් පවත්වා ගැනීමට අවධානය යොමු නොකිරීම. |
| (ආ) බදු ගෙවීම | බදු පනත්වල දක්වා ඇති නීති රීති අනුව කටයුතු නොකිරීම. |
| (ඇ) කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම. |